# කරදිය ධීවර කර්මාන්තය සහ මුහුදු බඩ ජනතාවගේ දරිද්‍රතාවය

එච්.ඩබ්. හරීෂා සඳරුවනි[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ධීවර කර්මාන්තයට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. එයට හේතුව අපගේ භෞතික පරිසරය තුළ ධීවර කර්මාන්තයට හිතකර සාධක බොහොමයක් තිබීම යි. දිවයින වටා පිහිටි කඩතොලු සහිත වෙරළ තීරය, පුළුල් මහද්වීප තටකය, හිරු එළිය හොඳින් මුහුදට වැටෙන නිසා මත්ස්‍යයන්ට අවශ්‍ය ශාක ප්ලවාංග තිබීම වැනි සාධකයන් ඒ අතර ප්‍රධාන වේ. මෙම සාධක පදනම් කර ගනිමින් මත්ස්‍ය නිෂ්පාදනය රටේ ආර්ථික සංවර්ධන කාර්යය සාක්ෂාත් කර ගැනීමෙහිලා උපයෝගී කර ගත හැකි බව පෙනේ. එහෙත් එය එසේ සිදු වන බවක් වර්තමානයේ පෙනෙන්නට නැත. මන්ද මත්ස්‍ය නිෂ්පාදනයේ පවතින දුර්වලතාවයන් හේතුවෙන් එම කර්මාන්තයේ නියැලෙන ධීවරයන් ගැටලු රාශියකට මුහුණ පායි. ඔවුන්ට ඔවුන්ගේ ජීවිකාව කර ගෙන යාමට ප්‍රමාණවත් තරම් මුදල් ප්‍රමාණයක් මේ හරහා ලැබේ ද යන්න ගැටලුවකි. එනම් ධීවර කර්මාන්තය තුළින් ඔවුන්ගේ දරිද්‍රතාවය අඩු වනවා ද යන්න විමසා බැලිය යුතු බැව් පෙනේ. එසේම රටේ සංවර්ධන කාර්යය සඳහා මත්ස්‍ය නිෂ්පාදනය යොදා ගත හැක්කේ කෙසේ ද යන්න අවධානයට යොමු කළ යුතු ය.

**මුඛ්‍ය පද** : ධීවර කර්මාන්තය, මත්ස්‍ය සම්පත සහ දරිද්‍රතාව

**හැඳින්වීම**

සමස්ත මානව සමාජය තුළම වර්ධනය වෙමින් පවත්නා සමාජ ප්‍රශ්නයක් ලෙස දරිද්‍රතාව හඳුන්වා දිය හැකි ය. බොහෝ නිමැවුම් කරන සමාජය විසින් ම නිෂ්පාදනය කරන ලද දිළිඳුකම ආදායම් ක්‍රම ඔස්සේ පමණක් නොව එහි සෑම අංශයක් ඔස්සේ ම අවධානයට ලක් විය යුතු සංකල්පයකි.

දරිද්‍රතාවය පිළිබඳ විවිධ ප්‍රවේශ ඔස්සේ විවිධාකාර නිර්වචනයන් ඉදිරිපත් කර ඇති අතර පොදුවේ හඳුනා ගත හැකි විශ්වීය නිර්වචනයක් තවම ඉදිරිපත් වී නැත. 1979 දී හැකියාවන් පිළිබඳ ප්‍රවේශයට අනුව අමාත්‍යර් සෙන් දක්වන ආකාරයට දරිද්‍රතාව යනු "පුද්ගලයෙකු ට ආත්ම අභිමානයෙන් යුතුව ජීවිතය පවත්වා ගෙන යාමට අදාළව තිබිය යුතු ශක්‍යතාවයන් නොමැති තත්ත්වයකි." බහුමානීය සංකල්පයක් වන දිළිඳුකම ප්‍රධාන මාන තුනක් ඔස්සේ දැක්විය හැකි බව 1992 දී චැම්බර් නම් ආර්ථික විද්‍යාඥයා අදහස් දක්වා ඇත. එනම් පැවැත්ම, ආරක්ෂාව සහ ආත්මාභිමානයයි.1977 දී නිකුත් කරන ලද එක්සත් ජාතීන්ගේ සංවර්ධන

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යා දෙවන වසර, hareeshasandaruwani186@gmail.com

වැඩසටහනට අයත් මානව සංවර්ධන වාර්තාවේ දිළිඳුකම පිළිබඳ පොදු දෘෂ්ටි කෝණ තුනක් ඔස්සේ අවධානයට ලක් කර ඇත. එනම්,

1. සමාජීය විද්‍යා විශ්ව කෝෂය දක්වා ඇති විග්‍රහය

2.ගැමි සමාජය දිළිඳුකම හඳුන්වා දෙන ආකාරය

3.ආර්ථික විද්‍යාඥයින්ගේ හා සමාජ විද්‍යාඥයින්ගේ ශාස්ත්‍රීය විග්‍රහය

දරිද්‍රතාව මැනීම සඳහා ජාත්‍යන්තර වශයෙන් හා දේශීය වශයෙන් පිළිගත් නිර්ණායක පවතී. ජාත්‍යන්තර නිර්ණායක ලෙස,

1. නිරපේක්ෂ දරිද්‍රතා රේඛාව

2. සාපේක්ෂ දරිද්‍රතා රේඛාව

දිනකට එක් පුද්ගලයකු සතු ක්‍රය ශක්ති සාම්‍ය මුදල ඇ.ඩො. 1ට අඩු නම් එය නිරපේක්ෂ දුගී බවයි. ලංකාවේ ජනගහනයෙන් 6.5%ක් මෙම ගණනය කිරීමට අනුව දුගී බවට අයත් වේ. දිනකට එක් පුද්ගලයකු සතු ක්‍රය ශක්ති සාම්‍ය මුදල ඇ.ඩො. 2ට අඩු නම් එය සාපේක්ෂ දුගී බවයි. ලංකාවේ ජනගහනයෙන් 45%ක් මේ තුළට අයත් වේ. දේශීය වශයෙන් භාවිත කරන නිර්ණායක ලෙස,

1. මානව දරිද්‍රතා දර්ශකය

2. ජිනි සංගුණකය

3. දුගී බවේ පරතර දර්ශකය

4. දරිද්‍රතා රේඛාව

දරිද්‍රතාවය එක් රටකට හෝ එක් ප්‍රදේශයකට සීමා වූවක් නොවේ. එය සෑම සමාජයකටම අයත් ප්‍රශ්නයකි. ලෝකයේ රටවල් බොහෝ ප්‍රමාණයක් දරිද්‍රතාවයෙන් පෙළේ. එයට එක් හේතුවක් ලෙස දැක්විය හැකි වන්නේ ජාතික ආදායමින් විශාල ප්‍රමාණයක් ඉතා කුඩා කුටුම්භ ප්‍රමාණයක් මත බෙදී යාමයි. ශ්‍රී ලංකාවේ නම් ජාතික ආදායමින් 54%ක් පමණ වැඩිම ආදායම් ලබන කුටුම්භ 20%ක ප්‍රමාණයක් භුක්ති විඳින අතර අඩුම ආදායම් ලබන 20%ක කුටුම්භ ප්‍රමාණයට හිමි වන්නේ ජාතික ආදායමින් 4%ක් පමණ ප්‍රමාණයකි. ලෝකයේ බොහෝ රටවල මෙම ප්‍රශ්නය දැකිය හැකි අතර ධීවර කර්මාන්තය තුළ ද මෙම දරිද්‍රතා තත්ත්වය ජනයා පීඩනයට පත් කරන සාධකයක් ලෙස පෙනේ.

ලෝකයේ රටවල්වලින් මුහුදු සීමාවන්ට අයත් රටවල් විශේෂයෙන් ම ධීවර කර්මාන්තය රටේ ආර්ථික සංවර්ධනයට දායක කර ගත හැකි නිෂ්පාදන ක්‍රියාවලියක් ලෙස යොදා ගනී. එහෙත් ධීවර කර්මාන්තය ආශ්‍රිත දරිද්‍රතාවයක් පවතී නම් එය එම කර්මාන්තය කඩා වැටීමේ ක්‍රියාවලියට ඍජුවම බලපායි. එම නිසා ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තය ආශ්‍රය කරගෙන ධීවර කර්මාන්තය හා දරිද්‍රතාවය අතර සම්බන්ධතාවයක් පවතිනවා ද යන්න විමසා බැලීමට පුළුවන.

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ප්‍රභේද තුනක් යටතේ දැක්විය හැකි ය. ඒවා නම් කරදිය ධීවර කර්මාන්තය, මිරිදිය ධීවර කර්මාන්තය හා කිවුල් දිය ධීවර කර්මාන්තය යි. කරදිය ධීවර කර්මාන්තය ප්‍රධාන අංශ දෙකක් යටතේ දැක්විය හැකිය. ඒවා නම් මහද්වීප තටකය හෙවත් වෙරළ බඩ ධීවර කර්මාන්තය හා ඈත මුහුදේ නැතහොත් ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය යි.

ලංකාවේ මුළු කරදිය මත්ස්‍ය නිෂ්පාදනයෙන් 90%ක් පමණ ලබා ගන්නේ වෙරළ බඩ නැතහොත් වෙරළාසන්න ධීවර බිම්වලිනි. වෙරළාසන්න මුහුදින් ලබා ගන්නා ප්‍රධාන මත්ස්‍ය වර්ග වනුයේ හාල් මැස්සා, සාලයා, සූඩයා, හුරුල්ලා, රන්නා, කොස්සා, දැල්ලා, ඉස්සා, පොකිරිස්සා යනාදී වර්ගයි. මෙහිදී භාවිතා කරන ප්‍රධාන ආම්පන්න මාදැල් සහ කුඩා සිදුරු සහිත දැල් ය. තව ද බිලී පිති හා අතංගු යනාදිය භාවිත වේ.

ඈත මුහුදේ ධීවර බිම්වලින් ලබා ගන්නා ප්‍රධාන මත්ස්‍ය වර්ග නම් ඇටවල්ලා, අලගොඩුවා, කුම්බලාවා, තලපතා, කොප්පරා, තෝරා, මෝරා, බලයා සහ කෙලවල්ලා යනාදිය යි. මෙහි දී භාවිතා කරන ප්‍රධාන ධීවර ආම්පන්න වනුයේ ලොකු සිදුරු සහිත පාවෙන කරමල් දැල් සහ මෝර මරුවැල් යනාදිය ය.

ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ උදාහරණ වශයෙන් ගාල්ල, හික්කඩුව, අම්බලන්ගොඩ ආදී දකුණු වෙරළ තීරය ආශ්‍රිතව මෙන්ම උතුරු වෙරළ තීරය ආශ්‍රිතව ද කරදිය ධීවර කර්මාන්තය බහුලව සිදු කෙරේ. ජනතාවට සේවා නියුක්ති අවස්ථා බිහි කිරීමටත්, පෝෂණ තත්වය නංවා ලීමටත්, විදේශ විනිමය ඉපැයීමටත් හැකි වීම තුළින් ජාතික නිෂ්පාදිතයට වැඩි දායකත්වයක් ලබා දෙමින් වැදගත් ආර්ථික කටයුත්තක් ලෙස ධීවර කර්මාන්තය ප්‍රමුඛස්ථානයක් ගෙන ඇත. එහෙත් ධීවර කර්මාන්තය තුළ ජනයා ඍජුව හා වක්‍රාකාරව පීඩනයට පත්වන, තවමත් නොවිසඳුනු ගැටලු ගණනාවක් පවතී.

**ධීවර ජනයාගේ ජීවන තත්ත්වය හා ඔවුන් මුහුණපාන ගැටළු**

ධීවර ජනයා ගත කරන ජීවිතය සුවදායක එකක් නොවේ. සිය ජීවිත අවදානම පෙනි පෙනී මුහුදු යන ධීවර ප්‍රජාව එයින් උපයන ආදායම සැලකිය යුතු එකක් නොවේ. ගැඹුරු මුහුදට ගොස් මාළු අල්ලන්නට ආයෝජනය කළ යුතු පිරිවැය විශාල ය. බෝට්ටු, දැල් ආම්පන්න, අයිස්, කණ්ඩායමට අවශ්‍ය ආහාර සහ ජලය සමඟ මුහුදට යන බහුදින ධීවර යාත්‍රාවකට ඉන්ධන වෙනුවෙන් පවා වියදම් කරන්නට සිදුවන මුදල කොපමණ ද යන්න වෙළඳපොළෙන් මාළු මිල දී ගන්නා පාරිභෝගිකයාට අවබෝධයක් නැත.

ධීවර කාර්මිකයාගේ අඩු ආදායම හා ණය ගැති භාවය, ධීවර ආම්පන්න වල ඇති හිඟය, නුපුහුණු ශ්‍රමිකයන් යෙදී සිටීම, ඉන්ධන මිල ඉහල යාම වැනි ගැටලුකාරී තත්වයන් ප්‍රමුඛව පවතී. කරදිය ධීවර කර්මාන්තය මුහුදු බඩ ප්‍රදේශයේ ජීවත් වන බොහෝ ජනයා හට සේවා නියුක්ති අවස්ථා බිහි කළ ද ඔවුන්ගේ ආදායම මූලික අවශ්‍යතා ඉටු කර ගනිමින් දරිද්‍රතාවයෙන් මිදීමට අවශ්‍ය වපසරිය සකස් නොකරන්නේ නම් එය ඵලදායී කටයුත්තක් ලෙස දැක්විය හැකි නොවේ. මන්ද ඕනෑම ආර්ථිකයක අභිමතාර්ථය වන්නේ ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් අවම මට්ටමින් හෝ සපුරා දී ඔවුන් දිළිඳුකමින් මුදවා ලීමයි.

මේ වන විටත් වගකිව යුතු ආයතන හා වගකිව යුතු පුද්ගලයන් මෙම ධීවර ජනතාවගේ ගැටලු විසඳීමට පියවර රාශියක් ගෙන තිබුණ ද ඒවා නිසි ලෙස ක්‍රියාත්මක වෙමින් ජනතා සුභ සාධනය සිදුවන බවක් නොපෙනේ. උදාහරණ වශයෙන් ධීවර ජනයා හට ණය පහසුකම් පුළුල් කිරීම, ධීවර රක්ෂණ ක්‍රමයක් ඇරඹීම, ධීවරයන් පුහුණු කිරීමේ ආයතන ඇති කිරීම, සාගර විශ්ව විද්‍යාල ඇති කිරීම, අයිස් නිෂ්පාදනාගාර ඇති කිරීම ආදී පියවරයන් ගණනාවක් ගෙන තිබුණ ද ඒවා නිසි ලෙස ක්‍රියාත්මක වනවා ද යන්න ගැටලුවකි. සමස්තයක් ලෙස ප්‍රායෝගික හා න්‍යායික වශයෙන් ධීවර ජනයාගේ ජීවන තත්වය කෙබඳු ද යන්න සොයා බැලිය යුතු ගැටලුවක් ලෙස පෙනේ.

ආදායම් ඉපැයීමේ මාර්ගයක් වශයෙන් වෘත්තීමය ධීවර කාර්මිකයින් වෙරළාසන්නයේ ජීවත් වෙයි. එහි මුඛ්‍ය ගැටලුව වන්නේ වෙරළාසන්න ප්‍රදේශවල තවමත් ස්ථිර නිවාස පවා නොමැති මුඩුක්කු පැල්පත් වල ජීවිකාව ගෙවන දරිද්‍රතා ඉමෙන් පහළ සීමාවේ ජීවත් වන ධීවරයින් වාසය කිරීමයි. ඔවුන්ගේ අඩු ආදායම් තත්වය ඔවුන් දිගු කාලීන ණය ගැතියන් බවට පත් කරයි. වර්ෂයේ සෑම දිනකම ඔවුන්ට මුහුදු යාමට එනම් ධීවර කටයුතුවල නියැලීමට හැකියාවක් නැත. එනම් වාරගං කාලයට මුහුදු රළ පහර අධික බැවින් ජීවිත අවධානම නිසා මුහුදු යාමෙන් වළකියි. එම කාලයට මෙම ධීවර ජනතාවට කිසිදු හව්හරණක් නොමැත. එසේම ධීවර ආම්පන්න වල හිඟය හා දැල් බෝට්ටු වැනි අනෙකුත් ධීවර උපකරණවල මිල දිනෙන් දින ඉහළ යාම නිසා ජනතාව තව තවත් පීඩනයට පත් වෙයි. ඉන්ධන මිල ඉහළ යාම නිසා ධීවර කාර්මිකයින්ගේ මුළු පිරිවැය මුළු ආදායම ඉක්මවා පවතින බැව් පෙනේ.

වෙනත් රටවල ධීවරයින් අපගේ මුහුදු සීමාවේ මසුන් ඇල්ලීම ද තවත් ගැටලුවකි. එබැවින් අපේ රටට අයත් මත්ස්‍ය සම්පත අඩු විය හැකිය. ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. තව ද මත්ස්‍ය සම්පත සඳහා ඇත්තේ අවිනිශ්චිත වෙළඳපොළ තත්වයකි. වෙළඳපොළ තුළ මිල තීරණය වීමේ දී කෙබඳු තත්වයක් ඇතිවේ ද යන්න කල් තබා නිශ්චය කළ නොහැක. එබැවින් කර්මාන්තය තුළින් ඇති වන ලාභය හෝ අලාභය දරා ගැනීමට ධීවර කර්මිකයාට සිදු වනු ඇත.

මත්ස්‍ය සම්පත සම්බන්ධයෙන් ඇති තවත් ගැටලුවක් නම් ප්‍රවාහනය, ගබඩා කිරීම හා කල් තබා ගැනීමේ ගැටලුවයි. අතීතයේ දී ධීවර කර්මාන්තය මහා පරිමාණුකූල නොවන්නට මුඛ්‍ය හේතුව වී ඇත්තේ මෙයයි. මුහුදු බඩ ප්‍රදේශ වල සිට රට

අභ්‍යන්තරයට මසුන් ප්‍රවාහනය කිරීමේදී ඇතැම් විට ඒවා පරිභෝජනයට නුසුදුසු තත්වයට පත්වේ. එයට යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි නොපැවතීම ද හේතුවකි. උදාහරණ වශයෙන් ධීවර වරාය, ගබඩා පහසුකම්, අයිස් නිෂ්පාදනාගාර, යාත්‍රා අලුත් වැඩියා කිරීම සිදු නොවීම හා නුපුහුණු ශ්‍රමය භාවිතා කිරීම වැනි ගැටලු රාශියක් පවතී.

ධීවර කර්මාන්තය ආශ්‍රිත ධීවර කාර්මිකයන් දිළිඳු තත්වයට පත් වීමට ඉහත සඳහන් කළ කරුණු රාශියක් බලපායි. මීට අමතරව 2004 දෙසැම්බර් 26 වන දින ඇති වුණු සුනාමි රළ පහර තත්වය ධීවර කර්මාන්තය මුලිනුපුටා දැමීමක් ලෙස පෙනේ. සුනාමි තත්වය හේතුවෙන් ධීවර කාර්මිකයන්ට ජීවිත හානි මෙන් ම දේපල හානි බොහොමයක් සිදු වුණි. ඔවුන්ගේ ඉඩ කඩම්, යාන වාහන, නිවාස බඩු බාහිරාදිය සියල්ල මුහුදු බත් විම හේතුවෙන් අද වන විටද ජනතාව තවමත් පීඩාවෙන් පසුවෙයි. ඔවුන් එම දිළිඳු භාවයෙන් මුදවා ගැනීමට ඇතැම් අවස්ථා වල දී වගකිව යුත්තන් උත්සාහ කළ ද ඉන් ප්‍රයෝජනයක් වී නොමැති බැව් පෙනේ. උදාහරණ වශයෙන් සුනාමි රළ පහරට හසු වී නිවාස අහිමි වූ බොහෝ දෙනාට වෙනත් ප්‍රදේශ වල නිවාස සංකීර්ණ ඉදි කර එහි ඔවුන් පදිංචි කරවීමට උත්සාහ දැරුව ද එය නිශ්ඵල ක්‍රියාවක් වී ඇත. එයට හේතුව නම් උපත් දවසේ සිට මුහුදු වෙරළ ආශ්‍රිතව ජීවිකාව ගෙවූ මිනිසුන් වෙනත් ප්‍රදේශයක ඉදි කළ නිවාස සංකීර්ණයක ජීවත් වීමට ඇති අකමැත්ත සහ නොහැකියාවයි. එබැවින් එම ජනතාව නැවත එම නිවාස හැර දමා වෙරළ ආසන්නයේ මුඩුක්කු සහ පැල්පත් සාදා ගෙන ජීවත් වේ. එබැවින් ඔවුන් තවමත් දිළිඳු මට්ටමේ පසුවෙයි. මෙම කරුණු වලට අනුව, කරදිය ධීවර කර්මාන්තය රටේ සංවර්ධනයට කෙබඳු දායකත්වයක් දැක්වුව ද එම ක්‍රියාවලිය තුළින් ජනයාගේ දරිද්‍රතාවය හෝ ජීවන තත්වයට වන බලපෑම කෙබඳුද යන්න පර්යේෂණයට භාජනය කළ යුතු කරුණක් ලෙස පෙනේ.

## ධීවර කර්මාන්තයේ වර්තමාන තත්ත්වය

වර්තමාන ධීවර කර්මාන්තය තුල නව තාක්ෂණික උපකරණ භාවිත වේ. එහි දී මුහුදේ ගැඹුර හා මාළු අහිත් සිටින ස්ථාන නිශ්චිතව දැන ගැනීමට ප්‍රතිධ්වනි මානය හා සෝනාර් භාවිත කරයි. තව ද ගොඩබිම සමගත් ඇත මුහුදේ පවතින ධීවර යාත්‍රා අතරත් සම්බන්ධතාවය පවත්වා ගැනීමට රේඩියෝ මෙවලම් භාවිත කරයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ද චන්ද්‍රිකා තාක්ෂණය හරහා කල් තබා කාලගුණය පිළිබද තොරතුරු සැපයීම නිසා එළඹෙන තත්වයට මුහුණ දීම සඳහා සූදානම් වීමට අවස්ථාව සැලසේ.

ශ්‍රී ලංකාවට විශාල මුහුදු සීමාවක් තිබේ. එක්සත් ජාතීන්ගේ මුහුදු සීමා නිර්ණය අනුව අභියාචනා කරන රටට අතිරේක මුහදු සීමාවක් ද අත්පත් කර ගන්නට ඉඩ ලැබේ. එහෙත් මෙම මුහුදු සීමා හරහා අපේ රටට වඩා විදේශ රටවල් ප්‍රයෝජන ගන්නා බව පෙනේ. අප රට මත්ස්‍ය සම්පත අපනයනය කළ ද එයින් විශාල ආර්ථික වාසියක් රටට අත් වන්නේ නැත. ධීවර ක්ෂේත්‍රය මෙරට ආර්ථිකයේ පංගු කාරීත්වය සියයට 1.8කි. 2014 අවුරුද්දේ සමස්ත මාළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 535,050 කි. 2014 අවුරුද්දේ මාළු, කරවල, ටින් මාළු සහ උම්බලකඩ ඇතුළු මත්ස්‍ය නිෂ්පාදන මෙට්‍රික් ටොන් මිලියන 78,712 ක සිට 2015 අවුරුද්දේ මෙට්‍රික් ටොන් මිලියන

120,048 දක්වා ආනයනය ඉහළ ගොස් ඇත. ටින් මාළු ආනයනය මෙට්‍රික් ටොන් 21,855ක සිට 2015 අවුරුද්දේදී මෙට්‍රික් ටොන් 49,016 දක්වා වැඩි වී ඇති අතර 2016 එනම් මේ වසරේ ජනවාරි මැයි මාසවල ටින් මාළු ආනයනය කලින්ට වඩා සියයට 31කින් වැඩි වී තිබේ.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව දෙරටේ ධීවරයන් මුහුදු සීමා උල්ලංඝනය කිරීම හේතුවෙන් ඇතිවිය හැකි අර්බුදයට තිරසාර විසඳුමක් ලබා ගැනීමේ එක් පියවරක් ලෙස සංරක්ෂිත මුහුදු කලාපයක් ප්‍රකාශයට පත් කර කෘතිම කොරල්පර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.

තව ද දිවි නැගුම ජාතික ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ධීවර අංශයේ ජල ජීවී වගා සංවර්ධනය සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රතිලාභීන් 15,889 කට අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය අවශ්‍යතා සපයා ඇති අතර එම කාලය තුළ රු. දස ලක්ෂ 950ක ආදායමක් උපයා ගැනීමට එම ප්‍රතිලාභීන් සමත් වී ඇත. විශේෂයෙන් විසිතුරු මසුන් වගාව වැඩි දියුණු කිරීම සඳහා සුවිශේෂී දායකත්වයක් දිවි නැගුමෙන් ලැබූ අතර ප්‍රතිලාභීන් 10,000කට ආසන්න සංඛ්‍යාවක් දායක කර ගෙන ඇති අතර එමගින් අපනයන වෙළඳපොළට ලබාදෙන විසිතුරු මත්ස්‍ය වගා දායකත්වය 30%කින් වැඩි වී තිබේ.

එසේම මෙරට මුහුදේදී අත් අඩංගුවට පත් වන ඉන්දීය ධීවර යාත්‍රා හෝ වෙනත් විදේශ ධීවර යාත්‍රා සතුව තිබී ලබා ගන්නා මත්ස්‍ය අස්වැන්නට නිසි වටිනාකමක් ලබා දී මත්ස්‍ය තොග වෙන්දේසි කර ලබා ගන්නා ආදායමෙන් කොටසක් මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීමටත්, ඉතිරි කොටස පොදු අරමුදලකට යොමු කර එමගින් උතුරේ ධීවර ජනතාවගේ සුබ සාධනය සහ විදේශ රටවල අත් අඩංගුවට පත් වන ධීවරයන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ සුබ සාධනය සිදු කිරීමත් අපේක්ෂා කෙරේ. මෙම ක්‍රමවේදය මඟින් ධීවර සංස්ථාව මුහුණ පා සිටින මූල්‍ය අර්බුදයට ද විසඳුම් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ඩොලර් මිලියන 62 ක ණය ආධාර යටතේ ගුරු නගර් වල ධීවර වරායක් ඉදි කිරීමට සැලසුම් කර ඇත.ඒ වෙනුවෙන් සියලු පහසුකම් වලින් සමන්විත නවීන තාක්ෂණික උපකරණ ඇතුළත් වරායන් ඉදි කිරීමට පියවර ගෙන ඇත.අඩියෙන් අඩිය කුඩා වරායන් ඉදි කරනවාට වඩා සියලු පහසුකම් වලින් සමන්විත ධීවර ප්‍රජාවට සිය අවශ්‍යතා සපුරා ගත හැකි ධීවර වරායන් කිහිපයක් හෝ ඉදි කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත.

කුඩා ධීවර යාත්‍රා වල කර්මාන්තයේ නිරත ධීවර කාර්මිකයන්ට කාලගුණ වෙනස්වීම ඇතුළු තොරතුරු ක්ෂණිකව ලබා දීම වෙනුවෙන් යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් සවි කිරීමට ද කටයුතු සැලසුම් කර ඇත.

යුරෝපා සංගමය ධීවර කර්මාන්තය විධිමත් කිරීමේ අරමුණින් නියාමන කටයුතු සිදු කරයි.එනම් නීති විරෝධි, වාර්තා නොකරන සහ අක්‍රමවත් ධීවර කටයුතු තුළින් අල්ලන ලද මත්ස්‍යයන් අපනයනය තහනමට ලක් කරයි. මේ අනුව යුරෝපා

සංගමයේ අංක 1005/2008 යන රෙගුලාසි යටතේ 2014 ඔක්තෝම්බර් මස 14 වන දින ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනය තහනම් කිරීමට යුරෝපා සංගමය කටයුතු කර ඇත. මෙම තහනමට හේතු වූ කරුණු වන්නේ මත්ස්‍ය කර්මාන්තයේ අක්‍රමවත් භාවයයි. එනම් ජාත්‍යන්තර නෛතික බැඳීම් ක්‍රියාත්මක කිරීමට තරම් නෛතික රාමුවක් නොමැති වීම, කාර්යක්ෂම හෝ ප්‍රමාණවත් නියාමන පද්ධතියක් නොමැති වීම, වැරදි කරුවන්ට දඩුවම් දීමේ පද්ධතියක් නොමැති වීම ආදී කරුණු ගණනාවකි.එහි ප්‍රධාන ගැටලුව වන්නේ වාර්තා නොකරන ලද මසුන් පිළිබඳ ප්‍රශ්නයයි. එනම් මත්ස්‍ය ප්‍රමාණය සහ මසුන් ඇල්ලීමට යොදා ගත් ක්‍රම පිළිබඳ වාර්තා නොකිරීමයි.

මෙම තහනම හේතුවෙන් ශ්‍රී ලංකාවට මහත් අවාසිදායක තත්වයක් උදා වී ඇත.ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට තලපත් සහ බලයා යන මසුන් අපනයනය කරන දෙවැනි විශාලම අපනයන කරුවාය.2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව යුරෝපයට යුරෝ මිලියන 74ක (රු.බිලියන 13) මසුන් අපනයනය කළේය. තහනම තුළින් වැඩිම වන්දිය ගෙවීමට සිදු වූයේ ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවට ය. 192,000කට වැඩි ගෘහස්තයන් ප්‍රමාණයක් සහ 222,160 කට වැඩි ධීවරයෝ සහ ධීවර කාන්තාවෝ මෙම තහනම තුළින් පීඩාවට පත් වී සිටිති.

**සමාලෝචනය**

ධීවර කර්මාන්තය අතීතයේ පටන් ජීවිකාව වශයෙන් කරගෙන යන මිනිසුන් කොට්ඨාසයක් අප රටේ ජීවත් වෙයි. ඔවුන් පිළිබඳ අවධානය යොමු කරමින් ඔවුන්ගේ ජීවන තත්වය දරිද්‍රතාවයෙන් මුදවා ගැනීම සඳහා ක්‍රියා කිරීම වැදගත් බව පෙනේ. රජයක් වශයෙන් මෙම ගැටලු සඳහා ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇති බව පැහැදිලි ය. නමුත් ගැටලුව වන්නේ එම ක්‍රියාමාර්ගයන් නිසි ලෙස ක්‍රියාත්මක නොවීමයි. එම නිසා ධීවර ජනයාට දරිද්‍රතාවයේ ගිලී සිටීමට සිදු වී ඇත. ඔවුන් දරිද්‍රතාවයෙන් මුදවා ගෙන මෙම කර්මාන්තය නිසි ලෙස උපයෝජනය කිරීම තුළින් ලබා ගත හැකි ප්‍රතිලාභ අති මහත් ය. එය රටේ ජාතික ආදායම ඉහළ නංවා ගැනීමට සේම ආර්ථික සංවර්ධන කාර්යය සඳහා ද ඉවහල් කර ගත හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

කුලතුංග ,ඒ. ඒ. (2013), "ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය" , ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

සම්පත් ද අල්විස් ගුණතිලක (2007), " ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් ", පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය